# මනස හා මනෝකාය

හයිඩ්‍රජන් පරමාණු දැවී හීලියම් පරමාණුවක් ඇතිවීමේ දී ඒ ඇතිවන හීලියම් පරමාණුවේ ස්කන්ධය හයිඩ්‍රජන් පරමාණුවල ස්කන්ධවල එකතුවට වඩා අඩුවෙයි. ඒ ස්කන්ධ සම්බන්ධයෙන් ඇතිවන වෙනස අයින්ස්ටයින් විද්වතාට අනුව ශක්තියක් වෙයි. මේ ශක්තිය විකිරණය ලෙස පිටවී යි. තාරකාවල මුල් අවධියෙහි දී හයිඩ්‍රජන් දැවී ශක්තිය විකිරණය ලෙස විශ්වයට මුදාහැරෙන්නේ ඒ අයුරෙන් ය.

ද්‍රව්‍යය හා විකිරණය යනු ශක්ති විශේෂ වෙයි. ද්‍රව්‍යය විකිරණය බවට ද, විකිරණය ද්‍රව්‍යය බවට ද පරිවර්තනය කළහැකි ය. ආලෝකය යනු විකිරණ විශේෂයකි. ආලෝකය ද ශක්ති විශේෂයක් වෙයි. ද්‍රව්‍යය අපට දැකගත හැකි ය. එහෙත් ආලෝකය දැකගත හැකි නො වෙයි. අපට යම් වස්තුවක් දැකිය හැක්කේ ආලෝකය නිසා බව පැහැදිලි ය. බටහිර විද්‍යාවට අනුව වස්තුවෙන් නිකුත්වන හෝ පරාවර්තනයවන හෝ ආලෝකය අපේ ඇස්වල ගැටීමෙන් පසු ඇතිවන ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස ද්‍රව්‍යය අපට පෙනෙයි. එහෙත් ආලෝකය හෝ වෙනත් විකිරණයක් හෝ නො පෙනෙයි.

ආලෝකය අපට නොපෙනුන ද ඇතැම් විකිරණ ඉන්ද්‍රිය ගෝචර වෙයි. සූර්යයාගෙන් අපට ලැබෙන විකිරණවලින් කොටසක් ආලෝකය වන අතර ඉන් නිකුත්කෙරෙන ඇතැම් විකිරණ හේතුවෙන් අපේ ශරීරයට උණුසුම් බවක් දැනෙයි. ඒ උණුසුම විකිරණය අපේ හම සමග ගැටීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන්නකි. මෙයින් කියැවෙන්නේ විකිරණයේ උණුසුම දනවන කොටස ඉන්ද්‍රිය ගෝචර බව ය. විකිරණයේ ඇතැම් කොටස් ඉන්ද්‍රිය ගෝචර වුව ද වෙනත් කොටස් ඉන්ද්‍රිය ගෝචර නොවන බව මෙයින් පැහැදිලි වෙයි.

ඉන්ද්‍රිය ගෝචර දේ පමණක් ඇතැයි කියන බටහිර විද්‍යාව පිළිබඳ මහාචාර්යවරු හා බටහිර විද්‍යාවේ අනෙක් සේවකයන් විකිරණයෙහි ඉන්ද්‍රිය ගෝචර නොවන දෑ පිළිබඳ ව කුමක් කියන්නේ ද? මේ අය රූපවාහිනී නාලිකා ඔස්සේ තම මතවාද ප්‍රචාරය කළ ද එවැනි කරුණු සම්බන්ධයෙන් ප්‍රසිද්ධ විවාදයකට නො එති. ඉන්ද්‍රිය ගෝචර නොවන දෑ නැතැයි කීව ද ඉන්ද්‍රිය ගෝචර නොවන ගුරුත්වාකර්ෂණය නැතැයි ඔවුහු නො කියති. ගුරුත්වාකර්ෂණය යනුවෙන් ප්‍රපංචයක් නැති බවත් ඒ නිව්ටන් විද්වතාගේ හිතළුවක් පමණක් බවත් ඔවුහු කිසි දිනෙක තේරුම් නො ගනිති.

අප ඇතැයි කියන්නේ සම්මුතියෙන් ඇති බව පිළිගත් දේට ය. ඉන්ද්‍රිය ගෝචර දෑ ඇතැයි ගැනීමට අපි පුරුදු වී සිටිමු. අපට සංස්කෘතියෙන් ඒ පුරුදු බොහෝමයක් කෙරී ඇත. එහෙත් අපි සංස්කෘතියේ බලපෑමක් නැතිව ද මම යනුවෙන් පුද්ගලයකු ඇතැයි ගනිමු. මිනිසුන් පමණක් නොව සියළු සත්තු එලෙස තමන් (මම) ඇතැයි ගනිති. ඒ මම පිළිබඳ දැනුම අනෙක් සියළු දැනුම්වලට වඩා ප්‍රධාන වෙයි. අනෙක් සියළු දැනුම් ඒ මමට (තමන්ට) සාපේක්ෂ වෙයි. මම යන්න අනෙක් ඉන්ද්‍රිය නොමැති වුව ද මනසින් ගොඩනගා ගන්නා දැනුමක් වෙයි. මනස පිළිබඳ හැඟීම ම මම යන සංකල්පයේ ඇතිවීම වෙයි. මනස පිළිබඳ හැඟීමක් ඇතිකරගත හැක්කේ මනසට මිස වෙනත් ඉන්ද්‍රියකට නො වෙයි. මනස විසින් මනස නිර්මානය කෙරෙන්නේ යැයි පැවසීමට එය ද හේතුවක් වෙයි.

ඉන්ද්‍රිය ගෝචර දෑ ඇති බව පිළිගන්නා ඇතැම්හු ඉන්ද්‍රිය ගෝචර නොවන දෑ ඇතැයි නො පිළිගනිති. (ඔවුන් ඉන්ද්‍රිය ලෙස ගන්නේ පංචේන්ද්‍රිය ය. ඔවුහු මනස ඉන්ද්‍රියක් ලෙස නොගනිති.) එහි පදනමෙහි ඇත්තේ අපේ ඉන්ද්‍රියවලට ලෝකයෙහි ඇති සියල්ල ග්‍රහණයකළ හැකිය යන්න හා ලෝකයෙහි යමක් ඇත්නම් එය අපේ ඉන්ද්‍රියවලට ග්‍රහණයකළ හැකිය යන්න ය. මෙය උපකල්පනයක් පමණක් බව කාහට වුවත් පැහැදිළි විය යුතු ය. එහෙත් අවාසනාවකට මේ උපකල්පනය බිඳෙන බව ඔවුන්ට කල්පනා නොවන්නේ ඇයි? ඉන්ද්‍රිය ගෝචර නොවන ගුරුත්වාකර්ෂණය, ආලෝකය වැනි දෑ ඇතැයි ඔවුන් විසින් ගැනෙන්නේ කිනම් හේතුවක් නිසා ද?

එයට හේතුව එවැනි දේ උපකල්පනයකර ඇතැම් ඉන්ද්‍රිය ගෝචර වන සංසිද්ධි පැහැදිලිකළ හැකිය යන්න නම් එය සතුටුදායක නො වෙයි. ආලෝකය ඇතැයි යනුවෙන් පිළිගැනෙන්නේ ඒ උපකල්පනයකිරීමෙන් වස්තු දැකිය හැක්කේ

කෙසේ දැයි තේරුම්කළ හැකි බැවින් යැයි සිතමු. එසේ ම ගුරුත්වාකර්ෂණය යනුවෙන් සංසිද්ධියක් ඇතැයි පිළිගැනෙන්නේ ඒ ආධාරයෙන් පොළොවට පොල් වැටෙන්නේ ඇයිදැයි තේරුම්කළ හැකි බැවින් යැයි සිතමු. එසේ නම් ඉන්ද්‍රිය ගෝචර දෑ පමණක් ඇතැයි යනුවෙන් ගැනීම වැරදි වෙයි. ඒ සංශෝධනයකර ඒ වෙනුවට එවිට ඉන්ද්‍රිය ගෝචර දෑ සහ ඉන්ද්‍රිය ගෝචර ප්‍රපංච තේරුම්කර දියහැකි දෑ (ඒවා ඉන්ද්‍රිය ගෝචර නොවුණ ද) ඇතැයි යනුවෙන් ගැනීමට සිදුවෙයි.

තවද බල්ලන්ට ඇසෙන ඇතැම් ශබ්ද (ශබ්ද තරංග) මිනිසුන්ට නො ඇසෙයි. බටහිර විද්‍යාඥයෝ ද මෙරට ඔවුන් අනුකරණයකරන්නෝ ද  ඒ ශබ්ද පවතින්නේ යැයි ගනිති. මේ සියල්ලෙන් පෙනී යන්නේ ඉන්ද්‍රිය ගෝචර දෑ පමණක් ඇතැයි යනුවෙන් ගැනීම සංගත නොවන ක්‍රියාවක් බව ය. බටහිර විද්‍යාඥයන්ට හා ඔවුන්ගේ අනුකාරකයන්ට ඉන්ද්‍රිය (එනම් මනස හැර අනෙක් ඉන්ද්‍රියන්ට) ගෝචර නොවන දෑ ද ඇතැයි ගැනීමට සිදුවෙයි. එහෙත් මෙරට අනුකාරක ඇංකර් උගත්තු ඉන්ද්‍රිය ගෝචර නොවන දෑ නැතැයි ගනිති. ඔවුන් එසේ කරන්නේ මෙරට දැනුමෙහි කියැවෙන පංචේන්ද්‍රියන්ට ගෝචර නොවන සංසිද්ධි ඇතුළු දැනුම ප්‍රතික්ෂේප කිරීමටත් එයට ගැරහීමටත් බව පැහැදිලි ය. ඔවුන්ගේ වැයම වී ඇත්තේ අපේ දැනුමට ගරහා ඒ ප්‍රතික්ෂේපකර බටහිර දැනුම් ආධිපත්‍යය අප මත පැටවීමේ බටහිර ව්‍යාපෘතියට හවුල්වීම ය. ඔවුහු බටහිරයන්ගේ නියෝජිතයෝ වෙති.

පංචේන්ද්‍රියන්ට ගෝචර දෑ පමණක් ඇතැයි ගැනීම කිසිසේත් ම සතුටුදායක නොවන බව ඉහත සඳහන් කරුණුවලින් පැහැදිලි විය යුතු ය. එහෙත් එයටත් වඩා මූලික ප්‍රශ්නයක් අපට ඇසිය හැකි ය. පංචේන්ද්‍රියන්ට ගෝචර දෑ පමණක් ඇතැයි ගැනීම පංචේන්ද්‍රියන්ට ගෝචර ද? එසේ ගැනීම වස්තුවක් නො වෙයි. එය කිසිසේත් පංචේන්ද්‍රියන්ට ගෝචර නො වෙයි. එසේ නම් පංචේන්ද්‍රියන්ට ගෝචර වන දෑ පමණක් ඇතැයි ගැනෙන්නේ පංචේන්ද්‍රියන්ට ගොචර නොවන උපකල්පනය කිරීමකින් ය. ඒ කිසිසේත් ම සතුටුදායක නො වෙයි. එයින් ද කියැවෙන්නේ පංචේන්ද්‍රියන්ට ගෝචර දෑ පමණක් ඇතැයි යන්න සංගත ව ඉදිරිපත්කළ හැකි කරුණක් නොවන බව ය.

අනෙක් අතට මෙහි තවත් පැත්තක් ද වෙයි. ද්‍රව්‍යය යනුවෙන් සාමාන්‍යයෙන් අප ගන්නා දෑ පංචේන්ද්‍රියන්ට ගෝචර වෙයි. එහෙත් විකිරණ පංචේන්ද්‍රියන්ට ගෝචර නො වෙයි. එසේ වුවත් ද්‍රව්‍ය මෙන් ම විකිරණ ද අයින්ස්ටයිනීය සාපේක්ෂතාවාදයට අනුව ශක්තියෙහි ප්‍රභේද වෙයි. ශක්තිය පංචේන්ද්‍රියන්ට ගෝචරවන විට ගතහැකිවන්නේ යැයි ද එසේ ගෝචර නොවන විට නොගතහැකිවන්නේ යැයි ද පංචේන්ද්‍රිය ගැන මහත් විශ්වාසයක් ඇතිකරගත් බටහිර විද්‍යාඥයන්ට හා ඔවුන්ගේ මෙරට අනුගාමිකයන්ට කිවහැකි ද? ශක්තිය පංචේන්ද්‍රියන් සම්බන්ධයෙන් එවැනි දෙබිඩි පිළිවෙතක් අනුගමනය කරන්නේ නම් එයට හේතුව කුමක් ද? එසේත්  නැත්නම් පංචේන්ද්‍රිය ශක්තිය සම්බන්ධයෙන් එවැනි දෙබිඩි පිළිවෙතක් අනුගමනයකරන්නේ ඇයි?

ඉහත සඳහන් කරුණු ඒ ආකාරයෙන් ඉදිරිපත්කෙළේ එක් අතකින් අපේ පංචේන්ද්‍රියන්ගේ ඇති සීමිතකම කියාපෑමට ය. අනෙක් අතට මනස හා මනෝකාය ගැන යම් සාකච්ඡාවක් වෙනත් පැත්තකින් ආරම්භකිරීමට ය. මනස හා මනෝකාය යනු එකක් ද නැත්නම් දෙකක් ද යන ප්‍රශ්නය අප දැනටමත් අසා ඇත. මනෝකාය යැයි කියැවෙන්න සම්බන්ධයෙන් දැනට ඇති දත්ත අනුව නම් මනෝකාය හා මනස දෙකක් බව පැහැදිලි ය. අද පොත්පත්වල සඳහන්කෙරෙන මනෝකාය එක් භවයක සත්ත්වයා ලබා ඇති භෞතික ශරීරයේ ස්වරූපය ගනියි. සත්ත්වයා භෞතික ශරීරයක් ඇති වෙනත් භවයක උපත ලදහොත් එවිට මනෝකාය ලබාගත යුත්තේ අළුත් භවයේ භෞතික ශරීරයේ ස්වරූපය යන්න ඉහත සඳහන් කරුණින් ගම්‍යවෙයි.

මනස එලෙස ඒ ඒ භවයේ භෞතික ශරීරයේ ස්වරූපය ගන්නා “දෙයක්” නො වෙයි. මනසේ “ස්වරූපය” භෞතික ශරීරයක “ස්වරූපය” යැයි කීම පසෙකින් තබා මනසට ඊනියා “ස්වරූපයක්” ඇතැයි කීම පවා වැරදි ය. අපි පළමුව මනස පිළිබඳව නොව මනෝකාය පිළිබඳව සාකච්ඡාකරමු. එය මනස පිළිබඳ සාකච්ඡාවකට ද වැදගත්වනු ඇත. මනෝකාය නිර්මානය වී ඇත්තේ කිනම් ද්‍රව්‍යයකින් ද? මනෝකාය පංචේන්ද්‍රියන්ට ගෝචර වෙයි ද? මනෝකාය මසැසින් දැකඇති පුද්ගලයෝ වෙත් ද? එසේ දැක ඇත්නම් ඉන් කියැවෙන්නේ එක්කෝ මනෝකායෙන් නිකුත්වන යම් විකිරණයකට හෝ මනෝකායෙන් පරාවර්තනය කෙරෙන යම් විකිරණයකට එසේ මනෝකාය දැක ඇති පුද්ගලයන්ගේ

© Prof. Nalin De Silva

ඇස් (හෝ වෙනත් ඉන්ද්‍රියක්) සංවේදී බව ය. (මෙහි දී ඉදිරිපත්කෙරෙන අදහස් දැනට ඇති දැනුම මත පදනම්වන බව අමුතුවෙන් කිවයුතු නො වෙයි.)

මෙහි දී අපට කිරිලියන් ක්‍රමයට ඡායාරූප ගතකිරීම ද වැදගත්වෙයි. කිරිලියන් ඡායාරූප මගින් සාමාන්‍යයෙන් අප භෞතික ශරීරය යැයි කියන ශරීරයෙන් බැහැර වුවක් රූපගත කෙරෙන බව පැහැදිලි ය. එහෙත් ඉන් කියැවෙන්නේ කිරිලියන් ඡායාරූප ගතකිරීමේදී භෞතික නොවන්නක් රූගත කෙරෙන බව නො වෙයි. (වැඩිදුර යැමට පෙර භෞතික යන්නෙන් අපෙන් තොරව පවතින්නක් ගැන නොකියැවෙන බව පැහැදිලිවිය යුතු ය. අපේ ප්‍රවාදවල එලෙස අපෙන් තොරව, එනම් අපේ ඉන්ද්‍රිය පද්ධතියෙන් හා මනසින් තොරව පවතින්නක් ගැන නො කියැවෙයි. සියළු දැනුම් මනසට, ඉන්ද්‍රිය පද්ධතියට හා සංස්කෘතියට සාපේක්ෂ ය.) අප සාමාන්‍ය ඇසට නොපෙනෙන යම් රූපයක් කිරිලියන් ක්‍රමයට ඡායාරූප ගතකෙරෙන්නේ යැයි සිතමු.

සාමාන්‍ය ඇසට නොපෙනෙන එහෙත් මසැසට වෙනත් යන්ත්‍රෝපකරණ මගින් හෝ වෙනත් අයුරකින් හෝ දැකගත හැකි (මනෝකාය වැනි) භෞතික වස්තුවකට සියුම්කයක්, සියුම් වස්තුවක් යැයි කීමේ වරදක් නැත. මනෝකාය සාමාන්‍ය මිනිසකුගේ මසැසට ගෝචර නොවන සියුම් ද්‍රව්‍යයකින් නිර්මානය වී තිබීම සිතාගත හැකිවෙයි. අපට ඇතැම් වායු නො පෙනෙයි. එහෙත් වායු වෙනත් ආකාරවලින් ඉන්ද්‍රිය ගෝචර වෙයි. මනෝකාය යම් ආකාරයකට භෞතික ශරීරයත් සමග බැඳී ඇතැයි යන්න ද පිළිගත හැකිවෙයි. ඇතැම්විට කිරිලියන් ඡායාරූපවලට ගැනෙන්නේ මේ මනෝකායේ කොටස් ද වියහැකි ය. එහෙත් මනෝකාය යන නම දුන් පමණින් මනෝකායේ ගුණ මනසට ද ආරෝපනයකිරීමට යැම නම් අනුවණකමක් වෙයි. මනස ද යම් ආකාරයකට මනෝකාය සමග බද්ධවී තිබීමට හැකි ය. (සත්ත්වයකුගේ මනස මනෝකාය සමග පමණක් නොව භෞතික ශරීරය සමග ද බැඳී ඇත.) එහෙත් එපමණකින් මනස ද ඊනියා සියුම් ද්‍රව්‍යයකින් නිර්මිත ව ඇතැයි සිතීම ද්‍රව්‍යවාදී දර්ශනයක් මත පදනම් ව කෙරෙන්නක් වෙයි. ඒ කෙසේවත් බුදුදහම සමග නො ගැලපෙයි. මනස ඊනියා සියුම් ද්‍රව්‍යයකින් නිර්මානය වී ඇතැයි කීම බුදුදහම ඖනිතවාදී ද්‍රව්‍යවාදයක් බවට පත්කරන මිසදුටු ප්‍රකාශයක් පමණක් වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva